සෞඛ්‍ය අමාත්‍යාංශය

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 291

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද

වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ

ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ

හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

சுகாதார அமைச்சு

பாராளுமன்ற வெளியீடு தொடர் இல - 291

பாராளுமன்ற அரச கணக்குகள் குழுவினால் முன் வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக

நிலையியல் கட்டளை இலக்கம் 119(4)இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும்

மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Ministry of Health

Parliamentary Series Number – 291

Submission of observations Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

පාර්ලිමේන්තු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංකය - 291
ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය

කාරක සභා නියෝගය/නිර්දේශය	නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
5.(i) විගණන අංශ සඳහා නිරීක්ෂණ ක්‍රමවේදයක් සහිත ව දැනට මුදල් අමාත්‍යාංශය මඟින් සකස් කරමින් පවතින විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procument system) සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, මහා භාණ්ඩාගාරය හා අවශ්‍ය අනෙකුත් පාර්ශ්ව සමඟ සාකච්ඡා කර අදහස් ලබාගෙන, ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ද සක්‍රීය දායකත්වය සහිතව එහි කටයුතු 2024 මාර්තු 31 දිනට පෙර අවසන් කිරීමට කටයුතු කිරීම	දැනට මුදල් අමාත්‍යාංශය මඟින් හඳුන්වා දී ඇති විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය (e-procument system) ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා ආරම්භයේ සිටම මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව යටතේ ඇති විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාංශය (e-GP Secretariat) වෙත සෞඛ්‍ය අමාත්‍යාංශයේ දායකත්වය ලබා දී ඇති බවත්, ඉදිරියේදීද සෞඛ්‍ය අමාත්‍යාංශයේ සක්‍රීය දායකත්වය අවශ්‍ය විටදී තවදුරටත් ලබා දීමට කටයුතු කරන බවත් දන්වමින් 2023.12.13 දිනැතිව ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව හා රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත පිටපත් සහිතව මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇත. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් භාවිත කරනු ලබන සියලු දත්ත පද්ධතීන් එකම වේදිකාවකට (platform) ගෙන ඒම Sri Lanka Health Blueprint නමින් වන විද්‍යුත් තොරතුරු පද්ධතියක් (Electronic Information System) මඟින් සිදු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කරමින් පවතී.
5.(ii) තත්වයෙන් අසමත් වෛද්‍ය සැපයුම් සිදු කළ සමාගම්/ ආයතන අසාධු ලේඛනගත කිරීමේ දී එම ආයතන වලට වෙනත් නම් වලින් පෙනී සිටීමින් නැවත වෛද්‍ය සැපයුම් කිරීම වැළැක්වීම සඳහා එම ආයතනවල හිමිකාරිත්වය ඇති සැපයුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගුවන් ගමන් බලපත්‍රය වැනි අනන්‍යතාවය තහවුරු කරගන්නා ලේඛනයන් මඟින් ම අසාධු ලේඛනගත කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම.	මෙම නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ආයතන/රෝහල් වල දැනටමත් අසාධු ලේඛණගත කිරීමට කටයුතු කර ඇති සැපයුම්කරුවන්ගේ විස්තර (ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල විස්තර සහිතව) ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.11.4 යටතේ කොන්ත්‍රාත් පැහැර හැරීම සම්බන්ධයෙන් අසාධුලෙඛණගත කිරීමට අපේක්ෂිත සැපයුම්කරුවන් සිටිනම් ඒ සම්බන්ධයෙන් වූ ඉල්ලීම්ද, එම ප්‍රසම්පාදනයන් හා සම්බන්ධ අදාළ සියළු තොරතුරු ද සමඟ අතිරේක ලේකම් (ප්‍රසම්පාදන)

	වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසටද වැඩි දුරටත් දන්වා ඇත. අසාධ්‍ය ලේඛණගත සමාගම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ තොරතුරු හුවමාරු කරගෙන අදාල සමාගම වෙනත් නමකින් පෙනී සිටින ආයතන පිළිබඳ විස්තර ලබා ගැනීමට කටයුතු කරනු ඇත.
5.(iii) යළි ඇණවුම් තොග මට්ටම (Re-order level) පාදක කරගත් කාර්යක්ෂම තොග පාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීම සඳහා රෝහල්වල දැනට ක්‍රියාත්මක වන රෝගියා දක්වා ඖෂධ සැපයුම් නිකුත් කිරීම සම්බන්ධ දත්ත ඇතුළත් "ස්වස්ථ මෘදුකාංග පද්ධතිය" සියලු රෝහල් ආවරණය වන පරිදි මාස 6ක් තුළ ස්ථාපිත කිරීම. මේ පිළිබඳව දිවයිනේ සියලු රෝහල් ආවරණය වන පරිදි සමාලෝචනයක් සිදුකර වාර්තාවක් මාස 3 කින් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම. මෙම කාර්යයට අවශ්‍ය උපකරණ සපයාදීම මුල් මාස 3 තුළ සිදුකළ යුතු අතර මෘදුකාංග පද්ධතිය පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් කටයුතු ඉතිරි මාස 3 තුල සිදුකළ යුතු බව.	2023 12.31 වන විට ප්‍රධාන හා ප්‍රාදේශීය වශයෙන්.වූ රෝහල් හා සෞඛ්‍ය ආයතන 1,161ක් මාර්ගගතව (Virtual Basis) ස්වස්ථ පද්ධතිය වෙත සම්බන්ධ කර ඇත. මේ වන විට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 361 ක් ද මාර්ගගතව (Virtual Basis) ස්වස්ථ පද්ධතිය වෙත සම්බන්ධ කර ඇත. සියලු සෞඛ්‍ය ආයතනවල 2024 වර්ෂය සඳහා වන ඇස්තමේන්තු කටයුතු ස්වස්ථ පද්ධතිය හරහා සිදු කරනු ලැබීය. විස්තර පහත පරිදි වේ.

No.	Level of Care	Hospital Type	Number of Hospitals		
			Line Ministry	Provincial Ministry	Total
1	Tertiary Care	National Hospital	2	-	2
2		Teaching Hospital	12	-	12
3		Specialized Teaching Hospital	6	-	6
4		Other Specialized Hospital	9	4	13
5		District General Hospital	13	7	20
6	Secondary Care	Base Hospital Type A	6	29	35
7		Base Hospital Type B	1	44	45
8	Primary Care	Divisional Hospital Type - A	1	66	67
9		Divisional Hospital Type - B	1	146	147
10		Divisional Hospital Type - C	1	269	270

11		Primary Medical Care Unit		8	536	544
12	MoH	Medical Officer of Health (MoH)				361
Total						1522

ඒ අනුව ප්‍රොන්ටෝ පද්ධතිය ක්‍රියාත්මක වූ රෝහල් 242 සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය මඟින් නම් කරන ලද සෞඛ්‍ය ආයතන 481 ක් තුළ ස්වස්ථ පද්ධතිය ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව අනෙකුත් ප්‍රාදේශීය රෝහල් හා ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිකාර ඒකක මාර්ගගතව ස්වස්ථ පද්ධතිය වෙත සම්බන්ධ කර 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු කටයුතු ස්වස්ථ පද්ධතිය හරහා සිදු කරනු ලැබීය. පද්ධතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දෘඩාංග (පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර) හා අන්තර්ජාල පහසුකම් සැපයීම සිදුකරමින් පවතින අතර එම දෘඩාංග හා අනෙකුත් පහසුකම් නියමිත පරිදි ලැබීමෙන් පසු ස්වස්ථ පද්ධතිය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවතී.

5.(iv) 2003 වසරේ දී සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව අහෝසි කරනු ලැබීම ද, ඒ වනවිට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරී තිබූ නීතිමය බලතල සම්බන්ධයෙන් විකල්ප නීතිමය රාමුවක් මෙතෙක් ස්ථාපනය කර නොමැති බවද, අනුකාරක සභාවේ නිරීක්ෂණයට ලක් විය. සෞඛ්‍ය සේවාව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන විශාල ප්‍රතිපාදන ප්‍රමාණය හා පැවරී ඇති දීප ව්‍යාප්ත සේවාවන් සැලකීමේදී ද ඒ සම්බන්ධව ඇති තීරණ නොපමාව ගැනීමේ අවශ්‍යතාවයන් ද, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය යන කරුණු හඳුනා ගත හැකි පරිදි වෙන්ව තිබීමේ අවශ්‍යතාවය ද සලකා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයට අමතරව සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් වෙනම ස්ථාපනය කළ යුතු බව. මාස 3ක් ඇතුළත සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ සියළුම අතිරේක ලේකම්වරුන්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා සියළු ප්‍රධාන මූල්‍ය නිලධාරීවරුන් ඇතුළු ඉහළ නිලධාරීන් සමඟ සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද අතර එහිදී ලද අදහස් හා යෝජනා අනුව තව දුරටත් කටයුතු කරමින් පවතී.

5.(v) වෛද්‍ය සැපයුම් සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් වෙනම ප්‍රසම්පාදන අංශයක් ඇති කිරීම යෝග්‍ය බවත්, ඖෂධ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ක්‍රියාවලියක් වන බැවින් නිසි ප්‍රසම්පාදන සැලැස්මකට හා ප්‍රසම්පාදන කාල සටහනකට අනුව කාර්යක්ෂමව කටයුතු කිරීම මඟින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය වැළැක්වීමට කටයුතු කිරීම කළ යුතු බව. හදිසි මිලදී ගැනීම් යටතේ සිදුවන අක්‍රමිකතා වැළැක්වීම මෙමගින් අරමුණු වන අතර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඒ ඒ පියවර වල වගකීම පැවරෙන නිලධාරියා කවරෙකු ද යන්න එම ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් විය යුතු බව. ඒ අනුව, ප්‍රමාදය සිදුකරන නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු බව.	ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා දීර්ඝ කාලයක් ගතවන බැවින් වෙනම් ප්‍රසම්පාදන අංශයක් ඇති කිරීම යෝග්‍ය බවට ලද නියෝගය අනුව දැනටමත් ප්‍රසම්පාදන අංශයක් පිහිටුවා ඇති බව දන්වමි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවන බව රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා වූ බැවින්, සියළුම ප්‍රසම්පාදන කටයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව සිදුකල යුතු අතර ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රසම්පාදන කටයුතු අදාල කාල රාමුව අනුව සිදුවන බව නිරීක්ෂණය කිරීම සඳහා සියළුම ආයතන වෙතින් තම ආයතනයට අදාලව අධීක්ෂණ සම්බන්ධීකරණ නිලධාරියෙකු නම්කර ඔහු පිළිබඳ විස්තර (නම, තනතුර,සේවා ස්ථානය, ජා.හැ.අ, විද්‍යුත් තැපැල් පිලිනය, ජංගම දුරකථන අංකය, ස්ථාවර දු.අ.) අතිරේක ලේකම් (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල් හා ආයතන වෙත 2023.12.13 දිනැතිව දන්වා ඇත. ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සෑම ආයතනයකම සිදු කරනු ලබන උපකරණ, ඖෂධ සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය පිළිබඳ ප්‍රසම්පාදන කටයුතු මෙන්ම අනෙක් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම සඳහා නිලධාරියෙන් (Liaison Officer) පත් කිරීමටත්, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අනුව ආවේක්ෂණය, අධීක්ෂණය සහ ප්‍රගති සමාලෝචන කටයුතු එම නිලධාරියා ලවා සිදුකර ගැනීමටත් කටයුතු සංවිධානය කරනු ඇත. ඒ අනුව මේ වන විට අදාළ ආයතන මඟින් ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය සඳහා නිළධාරියෙකු මේ වන විට පත්කර ඇත. ඒ අනුව ඒ ඒ ආයතන විසින් සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම, අදාළ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම සඳහා වෙන් කරන ලද මුදල සහ ක්‍රියාකාරී සැලැස්ම සමඟ වර්ෂය මුලදී අදාළ වගකිව යුතු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සමාලෝචනය කරමින් පවතී. ඖෂධ ප්‍රසම්පාදන ක්‍රියාවලියද ඉහත පරිදි වෛද්‍ය සැපයීම් අංශය හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ සම්බන්ධීකරණය සිදු කරමින් අධීක්ෂණය කිරීමට කටයුතු කරනු ඇත.

5.(vi) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සිදු කරන සැපයුම් ප්‍රමාදයන් පාලනය කිරීමට ඔවුන් වෙත ගෙවන 10% ක සේවා ගාස්තුවෙන් අධිභාරයක් අයකර ගැනීම.	වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සියළු කරුණු සම්බන්ධයෙන් අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව මඟින් මෙම කරුණු සම්බන්ධයෙන් ලැබෙන නිර්දේශ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරන අතර අදාල නිර්දේශ ලද පසු ඒවා දැණුම් දීමට කටයුතු කරනු ලැබේ. (ඇමුණුම 01)
5.(vii) 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 109 වගන්තියේ ප්‍රධාන කරුණු වලට පරිබාහිර කරුණු සඳහා ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ (Waiver of Registration) ලිපි නිකුත් කිරීම අත්හිටුවීම. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතික නිකුත් කිරීමේ දී දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය ඉතාමත් දුර්වල අභ්‍යන්තර පාලන පද්ධතියක් තුළ ක්‍රියාත්මක වන බැවින් වහාම එම ක්‍රමවේදය සඳහා විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම, ඒ සඳහා අනුක්‍රමික අංකයක් හඳුන්වා දීම, ආරක්ෂිත මුද්‍රාවක් භාවිතා කිරීම, අදාළ සහතිකය ඉල්ලුම්කරුට/ ආනයනකරුට සෘජුව ලබා දීම වහාම නතර කර ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට සෘජුව ලබා දීම හෝ ඖෂධ නිදහස් කිරීමට පෙර එම සහතිකයේ නිවැරදිතාවය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ වෙබ් අඩවිය මඟින් තහවුරු කර ගන්නා ලෙස ආනයන හා අපනයන පාලක ජනරාල්වරයාට උපදෙස් දීම වැනි ක්‍රමවේද හඳුන්වා දීම. ලියාපදිංචියෙන් නිදහස් කිරීම් (WOR) සහතික නිකුත් කළ යුතු අත්‍යවශ්‍ය අවස්ථාවන් හිදී එය නිකුත් කිරීම වගකීමක් සහිත කමිටුවක අනුමැතිය මත නිකුත් කිරීම සඳහා නව ක්‍රමවේදයක් සකස් විය යුතුය.	ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීමේදී එම ලිපි ප්‍රධාන විධායක නිලධාරීගේ අනුමැතියෙන් පමණක් නිකුත් කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි නැවැත්වීමටත්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබෙන එවැනි ඉල්ලීම් විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවකට යොමුකර කමිටුවේ නිර්දේශ මත පමණක් ලබා දීමටත් 2023.11.08 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණය කල අතර මේ වන විට එම තීරණය ක්‍රියාත්මක වේ. ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන ඖෂධ වල අවශ්‍යතාවයන් වෛද්‍ය සැපයුම් අංශයෙන් විමසා තහවුරු කර ගැනීමද සිදු වේ. ඒ අනුව මෙම සහතික නිකුත් කරනුයේ අත්‍යවශ්‍ය බව තහවුරු කර ගැනීමෙන් පසුව හා විශේෂඥ වෛද්‍ය කමිටුවේ නිර්දේශ මත පමණි. ඊට අමතරව ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ ලිපි ආරක්ෂිතව මුද්‍රණය කිරීමේ හැකියාව සම්බන්ධයෙන් රජයේ මුද්‍රණාලයාධිපති සමඟ සාකච්ඡා කල අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. එමෙන්ම මෙම ලියාපදිංචියෙන් නිදහස් කිරීමේ සහතිකය අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය පාර්ශවයන් වෙත පරීක්ෂණය කල හැකි වන පරිදි වෙබ් අඩවිය මඟින් පහසුකම් සැලසීමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බලන ලෙසත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙසත් උපදෙස් ලබා දී ඇත. (ඇමුණුම 02)

5 (viii) නව ඖෂධයක් ලියාපදිංචි කරවීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියට ලබා දී ඇති දින 300 ක කාල සීමාව නැවත සමාලෝචනය කර කෙටි කාලයක් තුළ ලියාපදිංචිය ලබාදීමේ වැඩ පිළිවෙලක් සැකසීමට ඇති හැකියාව සොයා බැලීම. එසේම, එකම ඖෂධය වෙළෙඳනාම රාශියකින් ලියාපදිංචි කිරීම සීමා කළ යුතු බව.	මේ වන විට නිසි වේලාවට ලියාපදිංචිය අලුත් කිරීමට නොහැකි වූ ඖෂධ සඳහා ලියාපදිංචි කාලය තාවකාලිකව දීර්ඝ කිරීමටත් ඒවායේ ලියාපදිංචිය ඉක්මණින් ලබා දීමටත් වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පවතී. එය අවසන් වූ පසු සහ නව කාර්යමණ්ඩලය බඳවා ගැනීමෙන් පසු ඖෂධයක ලියාපදිංචිය ලබාදීම සඳහා ලබා දී ඇති දින 300 ක කාල සීමාව සැලකිය යුතු ලෙස අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට හැකිවනු ඇත.
5.(ix) වෛද්‍ය සැපයුම් වට්ටෝරු සමාලෝචන කමිටුව නියමිත කාලයට රැස්කළ යුතු අතර එහි නිර්දේශයකින් තොරව කිසිදු වෛද්‍ය සැපයුමක් මිළදී නොගත යුතු බව. අදාළ කමිටු වාර්තාව වසර අවසානයේ දී නිකුත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කළ යුතු බව.	වට්ටෝරු සමාලෝචන කමිටු සෑම වසරකම නොපැවෙත්වෙන අතර, කැබිනට් මණ්ඩලයෙන් අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඖෂධ වසර 02 කට වරක්ද, ශල්‍ය හා රසායනාගාර අයිතම වසර 03 කට වරක්ද පැවැත්වේ. මෙම කමිටු වලදී, ඉතා දීර්ඝ අයිතම ලැයිස්තු සාකච්ඡා වන අතර, නිර්දේශ ලබා දීමේදී විශ්ලේෂණය කරන කරුණු ප්‍රමාණයද අධිකය. එම නිසා නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටු සාමාජිකයින් සජීවීව රැස්වීම අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා සහභාගී වන කමිටු සාමාජිකයින් රෝහල් වල සායනික විශේෂඥවරුන් හෝ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් වන හෙයින් කාල රාමුවකට යටත්ව රැස්වීම් පැවැත්වීම ඉතා අපහසු වුවත්, ප්‍රමාදයන් අවම කර ගැනීම සඳහා ඖෂධ සමාලෝචන කමිටු මුල් මාස 06 තුල පවත්වා නිම කිරීමටත්, අවසන් වාර්තාව සකසා පද්ධතිය යාවත්කාලීන කිරීම එම වසරේ ඇස්තමේන්තුව නිකුත් කිරීමට ප්‍රථම නිම කිරීමටත් සැලසුම් කර ඇත. ශල්‍ය හා රසායනාගාර අයිතම ද වසරක කාලයක් තුල නිම කිරීමටත් සැලසුම් කර ඇත. අතරමැදි කාලය තුලදී යොමුවන ගැටළු අදාල කමිටු වෙත e – mail මාර්ගයෙන් යොමු කර ලැබෙන නිර්දේශ අනුව අදාල අනුමැතිය මත ක්‍රියාත්මක කිරීමටත් යොමු කෙරේ. ශල්‍ය අයිතම සම්බන්ධයෙන් වන මී ලඟ වට්ටෝරු සමාලෝචන කමිටු රැස්වීම් 2025 වර්ෂයේ පැවැත්වීමට නියමිත අතර වට්ටෝරුගත ශල්‍ය අයිතම 8500 ක් පමණ පවතින බැවින්, සමාලෝචන කමිටු රැස්වීම් අවම වශයෙන් 50ක් පමණ ක්ෂේත්‍ර 35 ක් යටතේ පැවැත්විය යුතු වේ. (ඇමුණුම 03) ඒ අනුව ශල්‍ය වට්ටෝරු සමාලෝචන කමිටු රැස්වීම් පැවැත්වීම පහත පරිදි සිදු කෙරේ.

<table>
<tr><td></td><td>සාමාජිකයින් පත් කිරීම - 2024 ඔක්තෝබර්
කමිටු රැස්වීම් පැවැත්වීම සහ වාර්තා කැඳවීම - 2025 ජනවාරි සිට 2025 දෙසැම්බර් දක්වා
කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම - 2025 දෙසැම්බර්</td></tr>
<tr><td>5.(x) වෛද්‍ය සැපයුම් කළමනාකරණය සඳහා රජය විසින් දරනු ලබන විශාල ප්‍රතිපාදන ප්‍රමාණය සැලකිල්ලට ගෙන වෛද්‍ය සැපයුම් අවශ්‍යතා පුරෝකථනය හා සැපයුම් ක්‍රියාවලිය කළමනාකරණය සඳහා තොග කළමනාකරණය පිළිබඳව වෘත්තීමය සුදුසුකම් ඇති අයගේ සේවාව ලබා ගැනීමට කටයුතු කිරීම හා මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන්ට තොග කළමනාකරණය පිළිබඳ නිසි පුහුණුවක් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දීම හා තොග කළමනාකරණය පිළිබඳ යාවත්කාලීන දැනුමක් ලබා දීමට ක්‍රමවේදයක් සැකසීම.</td><td>වෛද්‍ය සැපයුම් කළමනාකරණය සඳහා තොග පාලන නිලධාරීන් සහ වෛද්‍ය සැපයුම් සහකාරවරුන් සෘජුවම සම්බන්ධ වේ. 2018 වර්ෂයේ සිට මෙම නිලධාරීන් සඳහා දේශීය මෙන්ම විදේශීය පුහුණු වීම් සංවිධානය කරන ලදී.

තොග පාලන නිලධාරීන්, වෛද්‍ය සැපයීම් සහකාර නිළධාරීන් ඇතුළු අනෙකුත් නිලධාරීන් සඳහා 2024 වර්ෂය තුල සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි අදාළ පුහුණු පාඨමාලාවන් සංවිධානය කරමින් පවතී (ඇමුණුම 04).

ස්වස්ථ පද්ධතිය කර්යක්ෂමව භාවිත කිරීම සඳහා සියලු පරිශීලකයන් සඳහා අවශ්‍ය පුහුණු සැසි පළාත් සහ ජාතික මට්ටමින් පැවැත්වූ අතර සමස්තයක් ලෙස විවිධ සේවා වලට අයත් සෞඛ්‍ය අංශ නිලධාරීන් 1,294 ක් පමණ මේ වන විට පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. විස්තර පහත පරිදි වේ.

<table>
<tr><th>Province</th><th>Total Number of officials</th></tr>
<tr><td>Northern Province</td><td>112</td></tr>
<tr><td>Central Province</td><td>80</td></tr>
<tr><td>North Western Province</td><td>102</td></tr>
<tr><td>North Central Province</td><td>73</td></tr>
<tr><td>Southern Province</td><td>130</td></tr>
<tr><td>Eastern Province</td><td>102</td></tr>
<tr><td>Sabaragamuwa Province</td><td>57</td></tr>
<tr><td>Uva Province</td><td>52</td></tr>
<tr><td>Western Province Stage I</td><td>54</td></tr>
<tr><td>Western Province Stage II</td><td>51</td></tr>
<tr><td>Western Province Stage III</td><td>44</td></tr>
</table>
</td></tr>
</table>

ජාතික මට්ටමෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන්

Category	Total Number of Participants
Medical Supplies Assistants	44
Medical Laboratory Technologist	50
Radiographers	50
Dispensing Officers	32

ප්‍රාදේශීය මට්ටමෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන්

Category	Total Number of Participants
Type C hospitals in Uva, Western and Sabaragamuwa Provinces	69
Type C hospitals in Eastern, Southern and North Central Provinces	67
Type C hospitals in Western and North Central Provinces	80
Type C hospitals in Northern Province	45

ජාතික මට්ටමෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන්

Category	Total Number of Participants
Medical Supplies Assistants	44
Medical Laboratory Technologist	50
Radiographers	50
Dispensing Officers	32

ප්‍රාදේශීය මට්ටමෙන් පවත්වන ලද පුහුණු වැඩසටහන්

Category	Total Number of Participants
Type C hospitals in Uva, Western and Sabaragamuwa Provinces	69
Type C hospitals in Eastern, Southern and North Central Provinces	67
Type C hospitals in Western and North Central Provinces	80
Type C hospitals in Northern Province	45

5.(xi) 2024 වසරේ අයවැය යෝජනා ද සැලකිල්ලට ගෙන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පරීක්ෂණාගාර පහසුකම් පුළුල් කිරීම සඳහා දැනටමත් රජය සතු ගොඩනැගිලි පහසුකම් උපයෝජනය කර ගනිමින් අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. නවීන උපකරණවලින් සමන්විත රසායනාගාර සංකීර්ණයක් පිහිටුවීම හා අවශ්‍ය කාර්ය මණ්ඩලය මාස 03ක් ඇතුළත බඳවා ගැනීමට කටයුතු කිරීම මේ සම්බන්ධයෙන් කිරුම් මිනුම් දෙපාර්තමේන්තුවට අයත් හෝමාගම පිහිටි ගොඩනැඟිලි සංකීර්ණයේ කොටසක් භාවිත කිරීමේ හැකියාව සලකා බැලීම හෝ වෙනත් සුදුසු සැලැස්මක් මාස 03ක් තුළ කාරක සභාවට ලිඛිතව දැනුම් දීම.	ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරයෙහි සේවා අවශ්‍යතාවය මත එහි කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලය 2023.08.22 දිනැති ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලදී. ඒ අනුව අනුමත කරන ලද තනතුරු වලට අදාල බඳවා ගැනීමේ පරිපාටි කෙටුම්පත් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද අතර, ඔවුන් විසින් ලබාදෙනු ලබන උපදෙස් මත එම බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කරමින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එමෙන්ම මේ වන විට රජයේ සියළු බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය වෙත අවශ්‍ය තාක්ෂණික කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් සිදුකර ඇත. ඒ අනුව අදාල බඳවා ගැනීමේ පරිපාටින් සඳහා සහ අවශ්‍ය අනෙකුත් අනුමැතීන් ලද වහාම ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය වෙත අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගැනීම් සිදුකල හැකිවේ. ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පරීක්ෂණාගාර පහසුකම් පුළුල් කිරීම සඳහා කිරුම් මිණුම් දෙපාර්තමේන්තුවට අයත් හෝමාගම පිහිටි ගොඩනැඟිලි සංකීර්ණයේ කොටසක් භාවිතා කිරීමේ හැකියාව සොයා බැලීම සඳහා අධිකාරියේ සභාපති ඇතුළු පිරිසක් එහි ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීමෙන් අනතුරුව එම ගොඩනැඟිලි සංකීර්ණය භාවිතා කල නොහැකි බව තීරණය කරන ලදී. පසුව දැනට පවතින ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ රසායනාගාරයම අළුත්වැඩියා සිදු කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයේ උපදෙස් පරිදි සිදු කරමින් පවතී.
5.(xii)රෝහල් මට්ටමින් ක්‍රියාත්මක ඖෂධ විකිත්සක කමිටු සෑම මසකම පළමු සතිය තුල රැස් කිරීමට පියවර ගැනීම.	රේඛීය අමාත්‍යාංශයට අයත් රෝහල් වල ආයතනික ඖෂධ විකිත්සක කමිටු රැස්වීම් (Institutional DTC) සහ ප්‍රාදේශීය ඖෂධ විකිත්සක කමිටු රැස්වීම් (Regional DTC) සඳහා MSD කාර්ය මණ්ඩලය සම්බන්ධ වන ලද්දේ Teleconference Facilities හරහාය. එම රැස්වීම් පැවැත්වීම සම්බන්ධ ලිපි සැලසුම් අංශය මඟින් නියමිත වාර්ෂික සැලසුමකට අනුව ඒ සඳහා අවශ්‍ය වෛද්‍ය සැපයීම් අංශයේ නිලධාරීන් නම්කර Teleconference රැස්වීම් සඳහා

	යොමු කරයි. ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සැපයීම තොරතුරු තාක්ෂණ අංශය (ICT Unit) මඟින් සිදු කරනු ලබයි. සෑම මසකම ඊට ඉදිරි මාසයෙහි ඖෂධ වික්‍රිත්සක කමිටු රැස්වීම් සිදු කිරීමට නියමිත රෝහල් හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාල වෙත යැවෙන ලිපියක් මඟින් අදාල කාර්ය පිළිබඳ දැනුවත් කිරීම සිදු කරනු ලබයි. අදාල රෝහල් සහ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාල මඟින් එම කමිටු රැස්වීම් පැවැත්වීමෙන් පසු එම අදාල වාර්තා අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) වෙත යොමු කරනු ලබන අතර එම වාර්තා වල අඩංගු වෛද්‍ය සැපයීම් අංශය මට්ටමින් විසඳුම් ලබා දිය නොහැකි ගැටළු ජාතික ඖෂධ වික්‍රිත්සක කමිටුවට (NDTC) ඉදිරිපත් කරනු ලබයි.
5.(xiii) සමීක්ෂණයක් සිදු කර රෝහල්වල දැනට තිබෙන හිඟ හා අතිරික්ත/ ඌන උපයෝජිත වෛද්‍ය උපකරණ පිළිබඳ දත්ත ඇතුළත් පරිගණක දත්ත පද්ධතියක් සකසා අවශ්‍යතාවය අනුව වෛද්‍ය උපකරණ රෝහල් අතර මාරු කිරීම හා ප්‍රමුඛතා පදනම (Priority List) මත වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදනය සිදුකිරීම. එහිදී ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය මඟින් අදාළ වාර්තා පවත්වා ගැනීම්.	මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.
5.(xiv) රට තුළ තිබෙන රෝහල් වර්ගීකරණය සිදු කර එම රෝහල් වර්ගය අනුව අවශ්‍ය වෛද්‍ය උපකරණ සඳහා පොදු පිරිවිතරයන් ඇතුළත් චක්‍රලේඛයක් ජීව වෛද්‍ය ඉංජිනේරු / රසායනාගාර සේවා අංශය මඟින් නිකුත් කිරීමට කටයුතු කිරීම. (මෙහි ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2023.12.31 දින වනවිට කාරක සභාව වෙත ලැබීමට සැලැස්විය යුතු බව.)	මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (රසායනාගාර සේවා) වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.
5.(xv) ඇතැම් ඖෂධ අදාළ උෂ්ණත්ව පරාසයන් තුළ ගබඩා නොකිරීම හේතුවෙන් ඒවායේ ගුණාත්මකභාවය පහත වැටීමක් සිදුවන බැවින්, ඖෂධ ප්‍රමිතීන් පිළිබඳ විමර්ශන කටයුතු වලදී භාවිත කිරීම සඳහා, ඖෂධ මිලදී ගැනීමේදී ටෙන්ඩර් සාම්පල් මෙන්ම	Sample Retention Room (නියදි රැඳවුම් කාමරය) සඳහා 2020 වර්ෂයේ යෝජනා වූ අතර, ඒ සඳහා යෝජනාවලියක්ද (Proposal) ද සකසා, 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කරන ලදී. නමුත් ප්‍රතිපාදන නොමැති හෙයින් එම යෝජනාව ක්‍රියාත්මක නොවුනි.

ලබාගන්නා නියැදි සාම්පල් හා එම තොගය රෝහල් වෙත නිකුත් කර භාවිතයෙන් අවසන්වන තුරු නිසි ප්‍රමිතීන්ට අනුකූලව ගබඩා කර තැබීමට කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට නැවත මෙම යෝජනාව ඇතුලත් කර ඇත. මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) වෙත උපදෙස් ලබා දී ඇත. වෙයන්ගොඩ අහාර ගබඩාව ඖෂධ ගබඩා කිරීම සඳහා යොදා ගැනීමට ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
5.(xvi) රෝහල් සඳහා නිකුත් කර තිබෙන ප්‍රධාන වෛද්‍ය උපකරණ වලට අදාළ නඩත්තු හා සේවා ගිවිසුම්, අත්‍යවශ්‍ය සායන කටයුතු සඳහා භාවිත වන වෛද්‍ය උපකරණ ක්‍රියා විරහිත වීම් සහ අලුත්වැඩියා කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය වන තොරතුරු ජීව වෛද්‍ය ඉංජිනේරු අංශය වෙත මාර්ගගත දත්ත පද්ධතියක් මඟින් වාර්තා කිරීම.	මේ සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා) වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති අතර ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පසුව දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.
5.(xvii) ප්‍රමාණවත් ඉඩකඩ සහිත නිසි ප්‍රමිතියෙන් යුක්ත ගබඩා පද්ධතියක් පවත්වා ගැනීමටත්, ඖෂධ වලට අවශ්‍ය උෂ්ණත්ව පරාසයන් පවත්වා ගැනීමටත්, ඖෂධ තොගවල ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කිරීමටත්, අවශ්‍ය පාලිත තත්ත්ව යටතේ ඖෂධ ප්‍රවාහනය සඳහා පහසුකම් සැලැස්වීමටත් කටයුතු කළ යුතු බව. සෞඛ්‍ය අමාත්‍යවරයා සහ වෙළඳ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා සිදුකර ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම මඟින් වෙයන්ගොඩ ආහාර ගබඩාව ඖෂධ ගබඩා කිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කරන ලෙස	වෛද්‍ය සැපයීම් අංශය විසින් දැනට භාවිතා කරන නාරාහේන්පිට / ශ්‍රාවස්තිපුර / වැල්ලවත්ත දිගන / ඉරණවිල යන ස්ථාන වල පිහිටි ගොඩනැගිලි වෛද්‍ය සැපයීම් ගබඩාගත කිරීමට භාවිතා කරන අතර අදාල පාරිසරික තත්වයන් හා එම ගොඩනැගිලි ඖෂධ ගබඩාගත කිරීම සඳහා සුදුසු ප්‍රමිතියෙන් යුක්ත නොවන බැව් නිරීක්ෂණය වන අතර එම ගොඩනැගිලි වෙනත් අවශ්‍ය කටයුතු සඳහා ඉදිකරන ලද ගොඩනැගිලි වේ. • දැනට අංගොඩ උප ගබඩා අංශයේ තොග ගබඩාගත කිරීමට භාවිතා කලත්, ගබඩා අංශයට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් නිසි ලෙස සම්පූර්ණ කර නොමැත. • 1984 වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය මත දැනට භාවිතා කරන වෛද්‍ය සැපයීම් අංශය ප්‍රධාන ගබඩා සංකීර්ණය ඉදිකර ඇතත් දැනට පවතින වාර්ෂික ඖෂධ අවශ්‍යතාවය මත පවතින ගබඩා ධාරිතාවය කිසිසේත්ම ප්‍රමාණවත් නොවීම. • රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව හරහා ලැබෙන තොග ගබඩා ධාරිතාවය ප්‍රමාණවත් නොවීම මත භාර ගැනීම් ප්‍රමාදවීම මත අතිරේක ලෙස ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදුවීම. • කල් ඉකුත් වන තොග නිසි පරිදි අපහරණය කරන තෙක් ගබඩාගත කිරීමට අවශ්‍ය අතිරේක ගබඩා ඉඩක් අවශ්‍ය වීම.

	• තත්වයෙන් අසමත්/ තාවකාලික භාවිතයෙන් ඉවත් කරන ලද තොග ගබඩාගත කිරීමට අතිරේක ගබඩා ධාරිතාවයක් අවශ්‍ය වීම. • පරිත්‍යාග හා නිසි පරිදි තොග භාර ගැනීමට අනුමැතිය ලැබෙන තෙක් අවශ්‍යතාවය මත තාවකාලික ඖෂධ තොග ගබඩා ගත කිරීමට අතිරේක ඉඩක් අවශ්‍ය වීම. • ප්‍රමාණවත් ආරක්ෂිත තොගයක් පවත්වාගෙන යාම සඳහා අතිරේක ගබඩා ප්‍රමාණයක් අවශ්‍ය වීම. (දැනට අප විසින් භාවිතා කරන ගබඩා ධාරිතාවය ආසන්න ලෙස වාර්ෂික අවශ්‍යතාවයෙන් දින 20-25 අතර තොගයන් ගබඩා ගත කිරීමට ප්‍රමාණවත් ධාරිතාවයකි.). • රජයේ ගිණුම් කාරක සභාවේදී ලබාදුන් නියෝග ප්‍රකාරව සැපයීම් වල නිදර්ශක අදාල තොගය භාවිතා කර අවසන් වන තෙක් තබා ගැනීම සඳහා අතිරේක ගබඩා ඉඩක් අවශ්‍ය වීම. • ස්ප්‍රිතු ගබඩා ගත කිරීමට නිසි අනුමැතිය සහිත ප්‍රමිතිගත ගබඩා අංශයක් අවශ්‍ය වීම. ඉහත තත්වයට ඉදිරිපත් කරන යෝජනා • හැකි ඉක්මණින් වේයන්ගොඩ ප්‍රදේශයේ පවතින ආහාර දෙපාර්තමේන්තුව සතු ගබඩා සංකීර්ණය පවරාගෙන සුදුසු ප්‍රතිසංස්කරණ හා ප්‍රමිතිගත තත්වය සම්පූර්ණ කරගෙන ඖෂධ ගබඩාගත කිරීමට කටයුතු කිරීම. • වෙනත් සුදුසු විකල්ප ක්‍රමවේදයක් මඟින් සාමාන්‍ය කාමර උෂ්ණත්ව පරාසයේ ගබඩා ගත කල හැකි ධාරිතාවයේ (දැනට පවතින ගබඩා ධාරිතාවයට අමතරව) වර්ග අඩි 60,000 ක (30°C අඩු) ගබඩා ධාරිතාවයක් හා වායු සමීකරණ උෂ්ණත්ව පරාසයේ (15°C - 25°C) වර්ග අඩි 40000 ගබඩා ධාරිතාවයක් ලබා ගැනීම. (අවශ්‍ය කාර්ය මණ්ඩලය හා අවශ්‍ය බර උසුලුම් යන්ත්‍ර, පැලට් ඇතුළු අනෙකුත් ගබඩා උපකරණ සහිතව).
5.(xviii) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ සියලුම ඇණවුම්වල ප්‍රගතිය සම්බන්ධයෙන් පිරික්සුම් ලැයිස්තුවක් (Check list) සැකසීම සහ එය වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂකගේ හා නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ දිනපතා අධීක්ෂණයට ලක් කිරීම.	ස්වස්ථ පද්ධතිය මඟින් මෙය සකසා ක්‍රියාවට නගමින් පවතී.

5.(xix) සියලුම හදිසි මිළදී ගැනීම් වලදී අදාළ ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආකෘති පත්‍රයක් හඳුන්වා දිය යුතු අතර එහි ඖෂධය පිළිබඳ තොරතුරු හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ ඇණවුම්හි ප්‍රගතිය, තොග ලැබීමේ දින වකවානු, තොග සැපයීමේ ප්‍රමාදයට වගකිව යුතු නිලධාරියා කවුරුන්ද යන්න සඳහන් කළ යුතු බව.	රජයේ ගිණුම් කාරක සභාවේදී සාකච්ඡාවට ලක් වූ කරුණු ඇතුළුව වෛද්‍ය සැපයීම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පූර්ණ අධ්‍යනයක් සිදුකර ලබා දෙනු ලබන නිර්දේශ, අදාල වගකිව යුතු ආයතන හා නිලධාරීන් වෙත යොමුකර ඒ අනුව කටයුතු කරවීම සුදුසු බවට යෝජනා වූ හෙයින් අදාල අධ්‍යනය සිදුකර නිර්දේශ ඉදිරිපත් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව කටයුතු කරනු ලබන ප්‍රධාන වගකිව යුතු නිලධාරීන් වන අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) හා ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුළු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් 2024.03.12 දිනැතිව පත්කර ඇත. (ඉහත ඇමුණුම 01) ඒ අනුව එම කමිටු නිර්දේශ ලද පසු මේ සම්බන්ධයෙන් දැණුවත් කිරීමට කටයුතු කරමි.
<u>සංක්ෂිප්ත සමුච්චිත නිර්දේශය</u> සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් සඳහා විධිමත් කාර්යක්ෂම ප්‍රසම්පාදන වැඩපිළිවෙළක් නොපමාව ස්ථාපනය කිරීම. මේ සඳහා කෙටි කාලීන හා මධ්‍යකාලීන වැඩසටහන් දින වකවානු සහිතව සකස් කර එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම් පැවරෙන නිලධාරීන්/අංශ ද ඇතුලත් කර සති හකය කාලයක් තුල රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම හා ඉන් අනතුරුව අදාල වැඩසටහන ක්‍රියාත්මක කර අවසන් වනතුරු මාස දෙකෙන් දෙකට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා ඉදිරිපත් කිරීම	
<u>4. විශේෂ විමර්ශනයට ලක් කල යුතු යැයි අනුකාරක සභාව විසින් නිර්දේශිත විගණන ඡේද</u> <u>(අ) - විගණන ඡේද අංක 5.7</u> 2021 වර්ෂය සඳහා වූ ඇණවුමෙහි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී නිවැරදි තීරණ නොගැනීම හා නිසි පරිදි සැලසුම් නොකිරීමත් හේතුවෙන් ඖෂධ තොගය ලැබීමට ආසන්න වශයෙන් වර්ෂ 02 ක කාලයක් ගතවී තිබීම, 2022 වර්ෂය සඳහා වූ ඇණවුමද ඇගයීම් මට්ටමේ පැවතීම හේතුවෙන් අත්‍යාවශ්‍ය ජීවිතාරක්ෂක ඖෂධයක් වන **Meropenem 1g** එන්නත 2022 අප්‍රේල් 22 දින වන විට වෛද්‍ය සැපයීම් අංශයේත්, රෝහල්වලත් මාසයකට අඩු තොග ප්‍රමාණයක් පමණක් පවතින බව නිරීක්ෂණය විය. මෙම ප්‍රමාදය	අදාල කරුණ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර ඇත. විමර්ශන වාර්තාව ඇමුණුම 05 මඟින් ඉදිරිපත් කර ඇත. නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වෛද්‍ය සැපයීම්) හා සභාපති (රාජ්‍ය ඖෂධ නීතිගත සංසංථාව) වෙත දන්වා ඇති අතර **ප්‍රගතිය පසුව** දැණුම් දීමට කටයුතු කරමි.

හේතුවෙන් එකක් රු.481 කට මිලදී ගත හැකිව තිබුණු මෙම ඖෂධය 2021 වර්ෂයේදී රජයේ රෝහල් විසින් එකක් රු.1,956 ත් රු.4,697 ත් අතර වූ විවිධ මිල ගණන් යටතේ රු.මිලියන 49.52 ක් වැයකර දේශීය වෙළඳපලින් මිලදී ගෙන තිබුණි.	
<u>ආ - විගණන ඡේද අංක 5.6</u> ගැබ් ගැනීම වළක්වන ඖෂධයක් ලෙස නිරෝගී කාන්තාවන්ට ලබා දෙන **Depogestin I (Depot Medroxy Progesterone Acetate)** ඖෂධයෙන් රු.මිලියන 87.03 ක් වූ එන්නත් මිලියන 1.2 ක් 2012 හා 2013 වර්ෂයන්හිදී මිලදී ගෙන තිබූ අතර 2018 ජුනි මාසයේදී පවුල් සෞඛ්‍ය කාර්යාංශය තුළදීම මෙම තොගය බෙදා නොහැර කල් ඉකුත් වී තිබුණි.	මූලික විමර්ශනය සඳහා කමිටුවක් පත්කර ඇති අතර නැවත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක HAF/INV/ADM/01/2024-01 හා 2024.02.09 දිනැති ලිපිය පරිදි නව කමිටුවක් පත්කර ඇත. (ඇමුණුම 06) එම කමිටුවේ නිර්දේශ ලද පසු දැණුම් දීමට කටයුතු කරමි.
<u>ඇ - විගණන ඡේද අංක 5.5</u> නව තාක්ෂණය හේතුවෙන් සිදුවන ඉල්ලුමේ වෙනස්වීම් සඳහා කාලීනව පිරිවිතර වෙනස් කිරීමටත්, ඒ සඳහා ස්වාධීන පිරිවිතර පාලන අංශයක් පිහිටුවීමටත්, වට්ටෝරු සමාලෝචන කමිටු නියමිත කාලයට රැස් කිරීමටත්, පිරිවිතර වෙනස්වීම මත ඇතිවන තොග අතිරික්තවීම් හා තොග කල් ඉකුත්වීම් වැළැක්වීමටත්, නවීන තාක්ෂණය තුළ ඉල්ලුමේ සිදුවන අඩු වැඩි වීම් පිළිබඳ ක්ෂණිකව හඳුනාගෙන අදාළ ඇණවුම් ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීමටත් හැකියාව තිබුණද එපරිදි කටයුතු නොකිරීම හේතුවෙන්, පිරිවැය රු.මිලියන 44.83 ක් වූ හදවත් රෝග ආශ්‍රිත ශල්‍ය කර්ම සඳහා භාවිතා කරනු ලබන coronary Stent bare metal ශල්‍ය අයිතමයන් 2019 හා 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළදී කල් ඉකුත් වී තිබුණි.	විමර්ශනයක් ආරම්භ කර ඇත. නිර්දේශ ලද පසු දැණුම් දීමට කටයුතු කරමි.

<u>ඈ - විගණන ඡේද අංක 5.37</u> චීනයේ CETC International Com Ltd වෙතින් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් කර තිබුණු ව්‍යාපෘති යෝජනාවක් පිළිගෙන, ඒ සඳහා The Hongkong and Shanghai Banking Corporation Limited වෙතින් එක්සත් ජනපද ඩොලර් මිලියන 72.25 ක් හා මහජන බැංකුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 12.75 ක් ලෙස එක්සත් ජනපද ඩොලර් මිලියන 85 ක ණය මුදලක් ලබාගෙන ක්‍රියාත්මක කර තිබුණි.	විමර්ශනයක් ආරම්භ කර ඇත. නිර්දේශ ලද පසු දැනුම් දීමට කටයුතු කරමි.

වෛද්‍ය රමේෂ් පතිරණ (පා.ම.),
සෞඛ්‍ය අමාත්‍ය.
2024/03/18

වෛද්‍ය රමේෂ් පතිරණ පා.ම.
සෞඛ්‍ය අමාත්‍ය
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය" අංක 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ නාහිමි මාවත,
කොළඹ 10.